ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2012/10/31 |

## 2012 ඔක්තෝබර් මාසයේ දී උද්ධමනය තවදුරටත් පහළ වැටෙයි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/2007=100) මගින් මනිනු ලබන උද්ධමනය, ආහාර ද්‍රව්‍යවල මිල ගණන් අඩුවීම හේතුවෙන් ලක්ෂ්‍යමය පදනම මත 2012 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 9.1 හි සිට ඔක්තෝබර් මාසයේ දී සියයට 8.9 දක්වා පහළ වැටිණි. කෙසේ වුවද, වාර්ෂික සාමාන්‍ය පදනම මත උද්ධමන අනුපාතිකය 2012 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 6.5 හි සිට ඔක්තෝබර් මාසයේ දී සියයට 6.8 දක්වා ඉහළ නැගිණි.

මූලික උද්ධමනය ලක්ෂ්‍යමය හා වාර්ෂික සාමාන්‍යය යන දෙයාකාරයේම පදනම මත පිළිවෙළින් පූර්ව මාසයේ පැවති සියයට 6.2 හා සියයට 5.3 හි සිට 2012 ඔක්තෝබර් මාසයේ දී සියයට 6.8 හා සියයට 5.4 දක්වා ඉහළ නැගිණි.




කො.පා.මි. දර්ශක අගය 2012 සැප්තැම්බර් මාසයේ දී පැවති 165.5 හි සිට ඔක්තෝබර් මාසයේ දී 165.0 දක්වා නිරපේක්ෂ වශයෙන් අඩු වෙමින් පූර්ව මාසයට සාපේක්ෂව සියයට 0.3 කින් පහළ වැටිණි. ආහාර කාණ්ඩයේ මිල ගණන් පහළ වැටීම (සියයට 1.3 කින්) දර්ශකයේ මෙම මාසික පහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. බොහෝ එළවළු වර්ග, මත්ස්‍ය හා මුහුදු ආහාර, ලොකු ළූණු, රතු ළූණු, අර්තාපල්, බිත්තර සහ සමහර පලතුරු වර්ගවල මිල ගණන් මෙම මාසය තුළ අඩු විය. කෙසේ වුවද, ළදරු කිරිපිටි, සීනි, පොල් සහ පොල් තෙල් මිල ගණන්වල ඉහළ යාමක් වාර්තා විය. ආහාර නොවන කාණ්ඩයේ රෙදිපිළි හා පාවහන් (සියයට 0.3 කින්); නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන (සියයට 1.0 කින්); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු (සියයට 0.5 කින්); ප්‍රවාහන (සියයට 0.2 කින්); විනෝදාත්මක හා සංස්කෘතික (සියයට 1.1 කින්); අධ්‍යාපන (සියයට 0.5 කින්); සහ විවිධ භාණ්ඩ හා සේවා (සියයට 0.4 කින්) යන උප කාණ්ඩයන්හි මිල ගණන් ඉහළ නැගිණි. මේ අතර, සෞඛ්‍යය සහ සන්නිවේදන යන උප කාණ්ඩයන්හි මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.